## VII වන පරිච්ඡේදය

# උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශණ අතුරුදහන්වීම

පසුබිම . . . . . . ..

කොළඹ නාලන්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ රෝහිත ප්‍රියදර්ශණ ආධුනික උප පොලිස් පරීක්ෂකවරයකු ලෙසින් 1986 දී පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනේය. නාලන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වූ අජිත් ජයසිංහ ද රෝහිත ප්‍රියදර්ශනත් සමඟ පොලිස් බලකායට බැඳුනු අයෙකි. රෝහිත ප්‍රියදර්ශණත් සමඟ අජිත් ජයසිංහ ගේ ඇසුර ඔවුන් දෙදෙනා නාලන්දය වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවෙහි නිරත වූ වකවානුව දක්වාම දිවෙන්නකි.

කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයෙහි මූලික පුහුණුවෙන් පසුව ඔවුන් දෙදෙනාම විශේෂ කාර්ය බලකායට ඇතුලත් කර ගන්නා ලදුව වැඩිදුර පුහුණුවක් දෙනු ලැබූහ. 1986 මැද භාගයේදී රෝහිත තිරුක්කෝවිල්හි පිහිටි විශේෂ කාර්යය බලකායීය කඳවුරට අනුයුක්තව සිටියේය. ඉන්දිය සාමසාධක හමුදාව ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ තිරුක්කෝවිල් කඳවුරෙහි සිටි විශේෂ පොලිස් බලකායීය නිලධාරීන් පිටතට මාරු කරනු ලැබූ බවක් පෙනේ. මෙම ක්‍රියාවලියේදී 1987 නොවැම්බර් මාසයේ රෝහිත ප්‍රියදර්ශණ වැල්ලවත්ත පොලිස් ස්ථානයට මාරු කරනු ලැබිණි. මෙම ස්ථාන මාරුවට ප්‍රධාන හේතුව පොලිස් ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවේ නිරතවීමට ඔහුට පහසුකම් සැලසීම බවක් පෙනී යයි. 1988 වර්ෂයේ අවසානය තෙක්ම හෙතෙම දිගටම කොළඹ සේවයෙහි නිරතව සිටියේය. 1989 ජනවාරි 02 වෙනි දිනදී ඔහු කැලණි පොලිස් කොට්ඨාසයට' මාරු කරනු ලදුව පෑලියගොඩ මූලස්ථාන පොලිස් ස්ථානයට අනුයුක්ත කෙරිණි. 1989 ජූනි මාසයේදී රෝහිත ප්‍රියදර්ශණ සපුගස්කන්ද පොලිස් ස්ථානයට මාරු කරනු ලැබ ඇත. හෙතෙම එම පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයට අනුයුක්තව සිටියේය. සපුගස්කන්ද පොලිස් ස්ථානයට මාරුවී යාමෙන් යම්තම් මසක කාලයක් ඇතුලත එම පොලිස් ස්ථානයට ඉහත කී ප්‍රහාරය එල්ල විණි.

මෙම කාල පරිච්ඡේදය තුළදී උපාලි සමූහ ව්‍යාපාරයට අයත් පුවත්පත් වලට අනුයුක්තව සිටි මාධ්‍යවේදී බන්දුල දිනපූර්ණ සාපරාධී ක්‍රියාවන්ටත් නීතිය ක්‍රියාවට නැංවීමටත් අදාල ප්‍රවෘත්ති කෙරෙහි අවධානය යොමු කරමින් එවැනි පුවත් එක්රැස් කිරීමෙහි නිරතව සිටියේය. එම ව්‍යායාමය ඇසුරෙන් ඔහු සොයාගත් තොරතුරු අලලා වාර්තා දිවයින සහ අයිලන්ඩ් පුවත්පත් වල පළවිය. අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමේ එක් ක්‍රමයක් වූයේ පොලිස් නිලධාරීන් සමඟ ඇසුරක් පවත්වාගෙන යමින් ඔවුන් සමඟ සම්මුඛ සාකච්ජා පැවැත්වීමෙනි. රෝහිත ප්‍රියදර්ශණ ඉහත කී ගණයෙහිලා සැලකිය හැකි පොලිස් නිලධාරියෙකි. දිනපූර්ණට අනුව රෝහිත වූ කලී යොවුන් වියේ පසු වූ උද්යෝගිමත් නිලධාරියෙකි. ඔහු එඩිතරය ; ස්වකීය විමර්ෂණ කාර්යයන්හිලා හෙතෙම නිර්භීතව ඉදිරිපත් වූයේය. කැලණි කොට්ඨාසය තුල සිදුවූ සොරකම් රැසක් මෙන්ම වෙනත් බරපතල අපරාධයන් ගණනාවක් එළිදරව් කිරීමෙහිලා හෙතෙම සාර්ථක මෙහෙයක් ඉටු කලේය. නොයෙකුත් සාක්ෂිකරුවන් පැවසූ අන්දමට ඇතැම් අපරාධකරුවෝ කඩාකප්පල්කාරීන් වශයෙන් ව්‍යාජයෙන් පෙනී සිටිමින් සොරකම් වලට සහ වෙනත් දරුණු අපරාධ වලට ඇබ්බැහි වී සිටියහ. රෝහිත ප්‍රියදර්ශණ මෙම මාදිලියේ ක්‍රියාකාරකම් කෙරෙහි සංවේදිව සිට ඇත. එබඳු කටයුතු නොසලකා හැරීමට ඔහු කිසිදිනක

සුදානම් නොවිය. කඩාකප්පල්කාරීන් මෙන්ම පොදු අපරාධකරුවන් යන දෙකොට්ඨාසයම එකම ගණයෙහිලා ඔහු විසින් සැලකිණි. ස්වකීය විවිධාකාර කුප්‍රසිද්ධ සාපරාධී ක්‍රියාවන් හේතුවෙන් ගෝනවල සුනිල්ගේ මහා පවුලද ප්‍රියදර්ශණගේ උකුසු ඇසට ලක්වෙමින් තිබුණු බව අපට ලබාගත හැකි සාක්ෂි මත නිගමනය කිරීම යුක්ති සහගත කරුණකි. මෙම ප්‍රදේශයේ පොදු අපරාධකරුවන් ඇතමෙකු ලත් දේශපාලන අනුග්‍රහය කෙරෙහි හෙතෙම සැලකිලිමත් නොවිය. පොදු අපරාධකරුවන් සාර්ථකව ග්‍රහණයට ගනිමින් අපරාධ විසඳීමෙහිලා ඔහු ඉටු කලා වූ මෙහෙයය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ වැනි ප්‍රදේශය භාරව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ පැසසුමට ලක්විණි. අපරාධ විමර්ෂණ ක්‍රියාවලියෙහිලා රෝහිත ප්‍රියදර්ශණ විසින් කෙරුණු සාර්ථක ප්‍රයත්නයන් සමහරක් හෙළිකෙරෙන ලේඛණයන් මෙම කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමත් ඔහුට එරෙහිව ඇතැම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් කරන්නට යෙදුණු චෝදනාවනුත් සලකා බැලිය යුතු වන්නේ මෙම පසුබිම තුල සිටය.

ඉම්තියාගේ චන්ද්‍රලතා පෙරේරා පවසන අන්දමට 1990 පෙබරවාරි 08 වන දිනදී ඇගේ සැමියා වූ වියුඩර් පෙරේරා (මොහු ගෝනවල සුනිල්ගේ සහෝදරයෙකි) කැලෑ ඇඳුමින් සැරසුණු පුද්ගලයින් කණ්ඩායමක් විසින් පැහැරගෙන යනු ලැබ තිබිණි. එවේලෙහි ඇගේ නිවසට පැමිණ සිය සැමියා රැගෙන ගිය තැනැත්තන් කිසිවකු හඳුනාගැනීමට ඇය අපොහොසත් වී ඇත. පෙබරවාරි 20 වෙනි දින සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමට අදාලව පෙබරවාරි මාසයේ අවසන් සතියේ පුවත්පත් කිහිපයකම ඔහුගේ ඡායාරූපය පලවී තිබිණි. සිය සැමියා පැහැරගෙන යාමට පැමිණි එක් පුද්ගලයකු වශයෙන් රෝහිත ප්‍රියදර්ශණ චන්ද්‍රලතා විසින් හඳුනාගන්නට යෙදී ඇත්තේ මෙම අවස්ථාවේදිය. පෙබරවාරි මස 09 වන දින චන්ද්‍රලතා සිය සහෝදරයා කැටුවවිත් වියුඩර් පැහැරගෙන යාම පිළිබඳව රනිල් වික්‍රමසිංහ මහතා හමුවූවාය. ඇය වික්‍රමසිංහ මහතාට පැමිණිල්ලක් කරමින් වියුඩර් නිරුපද්‍රිතව මුදාගැනීම සඳහා ඔහුගේ සහාය පැතුවාය. සිය නිවසට විත් වියුඩර් පැහැරගෙන ගිය තැනැත්තන් ඔවුන් කවුරුන්දැයි හැඳින්වීමක් නොකලද ඔවුන් පොලිස් නිලධාරීන් යැයි විශ්වාස කරන්නට තරම් ඇයට හේතුන් තිබූ බවක් ඇයගේ හැසිරීමෙන් පෙනී යයි. කැලණි පොලිස් ස්ථානයට ගොස් මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන ලෙසටත් ඇයට බියවීමට කිසිදු කරුණක් නොමැති බවටත් වික්‍රමසිංහ මහතා චන්ද්‍රලතාට උපදෙස් දුන්නේය. මේ අනුව චන්ද්‍රලතා කැලණි පොලිස් ස්ථානයට ගොස් සිය සැමියා පැහැරගෙන යාම සම්බන්ධයෙන් පැමිණිලි කළාය. පෙබරවාරි මස 13 වෙනි දිනදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතා ඇය වෙත පණිවුඩයක් යවමින් බියගම පොලිස් ස්ථානයටවිත් තමා හමුවන මෙන් ඇයට දැන්විය. ඇය එපරිදි කටයුතු කලාය. සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් දෙන ලද උපදෙස් පරිදි කාන්තා පොලිස් නිලධාරිනියක විසින් චන්ද්‍රලතාගේ ප්‍රකාශයක් සටහන් කර ගැනිණි. චන්ද්‍රලතා පවසන පරිදි වියුඩර් පැහැරගෙන යාමට රෝහිත ප්‍රියදර්ශණ සත්‍ය වශයෙන්ම සම්බන්ධ වූයේ නම් යටත් පිරිසෙයින් වියුඩර් පැහැරගෙන යාමෙන් ඉක්බිතිවම මෙකී සිද්ධිය පිළිබඳව සහකාර පොලිස් අධිකාරී පීරිස් දැනගෙන සිටින්නට ඇතැයි සිතන්නට බෙහෙවින්ම ඉඩ ඇත. කෙසේ වූවද, වියුඩර් පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද බවක් සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි ඇති නිල වාර්තා වලින් හෙළිනොවේ. මෙම සිද්ධියෙන් ඉක්බිතිවම රෝහිත ප්‍රියදර්ශණ අජිත් ජයසිංහට පවසා ඇත්තේ තමන් විසින් සෙසු පොලිස් නිලධාරීනුත් කැටුවවිත් වියුඩර් අත්අඩංගුවට ගන්නා ලද්දේ සාපරාධී කටයුතු සම්බන්ධයෙන් ඔහු හවුල්වී තිබීමේ හේතුවෙන් බවය. මෙම සාක්ෂිය හැරෙන්නට, රෝහිත ප්‍රියදර්ශණ සහ ඔහුගේ පොලිස් කණ්ඩායම විසින් වියුඩර්

අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහුට කුමක් සිදුවී දැයි යන්න සම්බන්ධයෙන් මෙම කොමිසන් සභාවට කිසිවක් නිශ්චිත වශයෙන් දැනගත නොහැකි වූ බව මෙහිලා සටහන් කළයුතුව ඇත. මෙම වකවානුව තුළ සිදුවූ වෙනත් බොහෝ අතුරුදහන්වීම් වලදී මෙන් විජයධර් තැමැත්තා ද පොලිස් අත්අඩංගුවේදී ජීවිතක්ෂයට පත්කරන ලදැයි යන්න නිගමනය කිරීම හැර වෙනත් විකල්පයක් අපට නොතිබේ. මෙම ප්‍රකාශය, ගෝනවල සුනිල්ගේ පවුලට සමීපව සිටි සියල්ලන්ටත් ඔවුන්ට අනුග්‍රහය දැක්වූ අයටත් නිසැකයෙන්ම තුරුස්සන්නක් වන්නට ඉඩ ඇත. මේ වූ කලී රාජ්‍ය බලයේ සිටි පුද්ගලයින්ට සමීපවීමේ අවකාශය ලත් තැනැත්තකු පොලීසිය විසින් ජීවිතක්ෂයට පත්කරනු ලද්දා වූ සුවිශේෂී අවස්ථාවක් බව පෙනේ. රෝහිත ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම මෙම පසුබිමෙහි සිට සලකා බැලිය යුතුව ඇත. ඉහත සඳහන් වුණු සිද්ධිය නිසා රෝහිත ප්‍රියදර්ශණ ` නැතිහංග කර දමන්නට ` යම් යම් පාර්ශවයන් කුමන්ත්‍රණය කළේද? පොලීසියේ බලාධිකාරිය නොදැනුවත්ව හා ඔවුන්ගේ අනුදැනුමකින් තොරව රෝහිත ප්‍රියදර්ශණ විජයධර්ට කළ දේ ඔහු විසින් කරන ලද්දක් නම් ඔහුගේ ක්‍රියා කලාපය නිසා ඔවුන් ඔහු කෙරෙහි උරණවිද? නොඑසේ නම්, ඔහුගේ ක්‍රියාකලාපය නිසා ඔවුහු අසීරුතාවයකට පත්වූවෝද? නැතහොත් ප්‍රියදර්ශණ කළ දේට ඔහුට ` දඬුවම් ` දිය යුතු යැයි රාජ්‍ය බලයේ සිටි තැනැත්තෝ ඉඟියක් කළෝද?

**අතුරුදහන්වීම . . . . . . . .**

1990 පෙබරවාරි මාසය වනවිට පරීක්ෂක කීර්ති අතපත්තු සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපතිවරයා වූයේය. රෝහිත ප්‍රියදර්ශණ මෙම පොලිස් ස්ථානයෙහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා විය.

ප්‍රියදර්ශණගේ වැඩිමහල් සහෝදරයා වූ සුවිතතාගොඩ මානත්තලාගේ දිනේෂ් ඉඳහිට ප්‍රියදර්ශණට දුරකථනයෙන් කථා කළේ ඔහුගේ සුවදුක් විමසීමේ අටියෙනි. මීට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ප්‍රියදර්ශණගේ පවුලේ උදවිය රද්දොළුගම නිවාස යෝජනා ක්‍රමයෙහි විසූ අතර ඔහු සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි නිලධාරී නිවාසයන්හි වාසය කිරීමයි. මෙකී නිලධාරී නිවාසයන් පොලිස් ස්ථාන ගොඩනැගිල්ලෙහි ඉහළ මාලයේ පිහිටා තිබිණ. පෙබරවාරි මස 02 වන දින සන්ධ්‍යාව සුපුරුදු පරිදි විය. දිනේෂ් පස්වරු 5.30 ට පමණ ස්වකීය බාල සහෝදරයාට දුරකථනයෙන් ඇමතිමක් කළේය. සාමාන්‍ය කරුණු සම්බන්ධයෙන් ප්‍රියදර්ශණ, දිනේෂ්ට කථා කර තිබූ අතර ප්‍රියදර්ශණ මැසීම සඳහා රද්දොළුවේ ඇඳුම් මහන්නෙකුට දී තිබූ ඇඳුම් වගයක් රැගෙන එන ලෙසද දිනේෂ්ට කියා තිබිණි. එම ඇඳුම් ලබාගෙන පසුදින ඒවා පොලිස් ස්ථානයට ගෙනැවිත් දෙන ලෙස ප්‍රියදර්ශණ, දිනේෂ්ට දන්වා තිබේ.

පස්වරු 6.00 ට පමණ ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධාරි (SDO) වශයෙන් රාජකාරි භාරගෙන ඇත. සාමාන්‍යයෙන් එබඳු නිලධාරීන් පත්කරනු ලබනුයේ නිත්‍ය කාර්ය භාර නිලධාරීන් නොමැති අවස්ථාවලදී ඔවුන් වෙනුවෙන් වැඩබැලීම පිණිසය. සෑම රාත්‍රියක් සඳහාම එබඳු නිලධාරියකු පත්කිරීම සාමාන්‍ය පිළිවෙතව පැවතිණි. මෙම පත්වීම ස්ථානාධිපති විසින් කරනු ලබන්නකි. මෙම අවස්ථාවේදීද ප්‍රියදර්ශණ ස්ථානයෙහි කාර්ය භාර නිලධාරී වශයෙන් පත් කරන ලද්දේ පොලිස් ස්ථානාධිපති / පරීක්ෂක කීර්ති අතපත්තු විසිනි.

එදින සන්ධ්‍යාවේ පසුභාගය වනවිට කීර්ති අතපත්තු බියගම පිහිටි 'බියගම විලේජ් හොටෙල්' හි රැස්වීමකට සහභාගී වනු පිණිස පොලිස් කොස්තාපල් රියදුරු කෙනෙකු කැටුව පොලිස් ස්ථානයෙන් බැහැර ගොස් ඇත. පොලීසියේ වහරන බසින් නිලධාරීන් වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරී සමඟ පවත්වන්නා වූ නිල සාකච්ඡාවන් 'රැස්වීම්' යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම රෙස්ටුරන්ට් හි අයිතිකරු වූයේ ගාමිණී ජයරත්න නැමැත්තෙකි. මෙම ස්ථානය නිත්‍යානුකූල මෙන්ම එතරම් නිත්‍යනුකූල නොවූ විවිධාකාර කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන්නක් බවට සාක්ෂි ඉදිරිපත් කෙරිණි. සත්‍ය වශයෙන්ම එක් සාක්ෂිකරුවකු සඳහන් කර සිටියේ මෙම 'ස්ථානය' විවිධාකාර කටයුතු සඳහා ජෝඩු විසින් පාවිච්චි කරනු ලබන බවකි. මෙබඳු ස්ථානයක ස්වකීය සාකච්ඡාවන් පැවැත්වීම සුදුසු යයි මෙම කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් කල්පනා කලේ ඇයි දැයි යන්න පිළිබඳව කිසිදු සහේතුක කරුණක් කෙනෙකුට සිතාගත නොහැක.

සපුගස්කන්ද පොලිස් ස්ථානයෙහි ප්‍රධාන කවුළුවෙහි රාජකාරියෙහි නිරතව සිටියේ පොලිස් සැරයන් 11343 සිරිවර්ධන නැමති අයෙකි. ඔහුගේ පත්වීම උපසේවා කාර්ය භාර නිලධාරී යනුවෙන් හඳුන්වනු ලබන්නකි. 'උපසේවා කාර්ය භාර නිලධාරීන්ගේ' කර්තව්‍යයන්ට පොලිස් ස්ථානයට ගෙනෙනු ලබන සැකකරුවන් සහ නඩු භාණ්ඩ නිල වශයෙන් භාරගැනීම, දුරකථන ඇමතුම් ලබාගැනීම (දුරකථන ක්‍රියාකරු නොමැති විටදී) පැමිණිලි භාරගැනීම ආදිය ඇතුලත් වෙයි. අදාල දිනදී සිරිවර්ධන නැමති අය පස්වරු 2.00 සිට පස්වරු 10.00 දක්වා රාජකාරියෙහි නිරතව සිටියේය. සිරිවර්ධන වූ කලී මෙම පොලිස් ස්ථානයට නවක නිලධාරියෙක් නොවේ. 1990 පෙබරවාරි මාසය වනවිට හෙතෙම වසරකට ආසන්න කාලයක් සපුගස්කන්ද පොලිස් ස්ථානයට අනුයුක්තව සිට ඇත. එබැවින් සියළුම නිලධාරීන් තමන් දන්නා හඳුනන බවත් තමාට කවර නිලධාරියකුගේ වුවද කටහඬ දුරකථනයෙන් හඳුනාගත හැකි බවත් හෙතෙම කියා සිටී.

පස්වරු 7.30 පමණ වනවිට ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙහි අපරාධ විමර්ශන අංශයෙහි සිට ඇත. හෙතෙම එම අවස්ථාවේදී මාධ්‍යවේදී බන්දුල දිනපූර්ණත් නජ් සහ ගාමිණී නම් වූ තවත් දෙදෙනකුත් සමඟ සාකච්ඡාවක නිරතව සිට ඇත. බන්දුල දිනපූර්ණ ප්‍රියදර්ශණ හමුවීමට ගොස් ඇත්තේ එම ප්‍රදේශයෙහි සාපරාධී විමර්ශන කටයුතු පිළිබඳවත් එබඳු කටයුතු සම්බන්ධයෙන් කෙරුණු විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳවත් ප්‍රවෘත්ති ලබාගනු පිණිසය. ස්වකීය පෞද්ගලික කරුණු දෙකක් සම්බන්ධයෙන් උදව් උපකාර ලබාගනු පිණිස නජ් සහ ගාමිණී යන දෙදෙන ප්‍රියදර්ශණ හමුවන්නට ගොස් ඇත.

පස්වරු 8.00 ට පමණ පොලිස් ස්ථානාධිපතිවරයාගේ මේසය මත වූ දුරකථනය නාද වෙන්නට විය. එබැවින් සිරිවර්ධන දුරකථනය වෙත ගොස් එම ඇමතුමට පිළිතුරු දුන්නේය. සිරිවර්ධනට අනුව එම ඇමතුම දී ඇත්තේ පොලිස් ස්ථානාධිපති පරීක්ෂක අතපත්තු මහතා විසින්මය. අමතන්නාගේ කටහඬ කිසිදු අපහසුවකින් තොරව හෙතෙම හඳුනා ගත්තේය. තවද අමතන්නා තමා ස්ථානාධිපති යනුවෙන් හැඳින්වීමක්ද කර ඇත. ප්‍රියදර්ශණ එතැනට කැඳවන මෙන් හෙතෙම සිරිවර්ධනට දන්වා ඇත්තේය. මේ අනුව සිරිවර්ධන ඉහත කී තිදෙනා සමඟ සාකච්ඡාවක නිරතව ප්‍රියදර්ශණ සිටි තැනට ගොස් ස්ථානාධිපති දුරකථනයෙන් කථා කරන බවත් ප්‍රියදර්ශණට කථා කිරීමට ඔහුට අවශ්‍ය වී ඇති බවත් දන්වා සිටියේය. මේ අනුව ප්‍රියදර්ශණ දුරකථනය තිබූ තැනට ගොස් එම ඇමතුමට පිළිතුරු දී ඇත. ස්ථානාධිපතිවරයා සහ

ප්‍රියදර්ශණ අතර ඇති වූ කථා බහ තමාට ඇසුණු බවක් සිරිවර්ධන නොකියයි. කෙසේ වුවද රිසිවරය ආපසු තැබීමෙන් පසුව ප්‍රියදර්ශණ යලිත් අමුත්තන් සිටි තැනට විත් එම ඇමතුම පොලිස් ස්ථානාධිපතිගෙන් ලද්දක් බවත් තමාට බියගම විලේජ් හෝටලයට එන ලෙස ස්ථානාධිපතිවරයා දන්වා සිටි බවත් එම රෙස්ටුරන්ට් එකට ජම පිණිස වාහනයක් ඔහු විසින් එවනු ලබන බවත් බන්දුල දිනපූර්ණටත් අනෙකුත් දෙදෙනාටත් ඔහු දන්වා සිටියේය. මෙම කරුණු වලින් පැහැදිලිවම පෙනී යනුයේ පොලිස් ස්ථානාධිපති ප්‍රියදර්ශණට දුරකථනයෙන් කථා කලේ බියගම විලේජ් හෝටලයෙහි සිට බවය. මක් නිසාදයත්, ඔහු ප්‍රියදර්ශණට දන්වා සිටියේ ` බියගම විලේජ් හෝටලයට එන ලෙස ` මිස එකී හෝටලයට ` යන ` ලෙස නොවන බැවිනි. තවද, ප්‍රියදර්ශණ හැරුණු විට ( මොහු අපරාධ විමර්ශන අංශයෙහි ස්ථානාධිපති විය ) කීර්ති අතපත්තු හැර වෙනත් ස්ථානාධිපතිවරයකු නොවූයෙන් ` ස්ථානාධිපති ` ගේ අනන්‍යතාවද බෙහෙවින් පැහැදිලි වන්නකි.

ඉක්බිති ප්‍රියදර්ශණ පොලිස් ස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළ මාලයට නැඟ පොලිස් සැරයන් 8577 නන්දසේන විවේක ගනිමින් සිටි කාමරයට විත් ස්ථානාධිපති තමාට දුරකථනයෙන් කථා කොට ` සාකච්ඡාවක් ` සඳහා බියගම විලේජ් හෝටලයට එන ලෙස දන්වා සිටි බව ඔහු කිය. පොලිස් ස්ථානයෙන් තමන් පිටත්ව යන විට කාර්ය භාර නිලධාරී රාජකාරිය නන්දසේනට භාරදෙන ලෙස ` ස්ථානාධිපති ` තමාට දැන්වූ බවද ප්‍රියදර්ශණ නන්දසේනට කිය. මේ අනුව, නන්දසේන පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධාරී ලෙසින් රාජකාරි භාරගත්තේය.

කලින් නිල ඇඳුමින් සැරසී සිටි රෝහිත ප්‍රියදර්ශණ විනාඩි දහයක පමණ වේලාවකින් කමිසයක් සහ කලිසමකින් සැරසී ආපසු උපසේවා නිලධාරියා රාජකාරියෙහි නිරතව සිටි ස්ථානයට විත් අදාල නිල ලේඛණයෙහි ( සාමාන්‍ය තොරතුරු පොත) සටහනක් ඇතුලත් කලේය. ප්‍රියදර්ශණ භාරයේ තම රාජකාරි සේවා රිවෝල්වරය තිබූ බව සාක්ෂි වලින් කියැවිණි. අනතුරුව, හෙතෙම බන්දුල දිනපූර්ණ සහ අනිකුත් අමුත්තන් දෙදෙනා සිටි තැනට ගොස් ඔවුන්ගෙන් ` සමුගත්තේය.` දිනපූර්ණ පොලිස් ස්ථානයෙහි ප්‍රධාන දොරටුව තෙක් ප්‍රියදර්ශණ කැටුව පසුපසින් ගියේය. එසේ පිටවී යද්දී බියගම විලේජ් හෝටලයට යාමට එන ලෙස හෙතෙම දිනපූර්ණට ද ඇරැයුම් කර ඇත. ප්‍රියදර්ශණ විසින් කලින් ලේඛණයෙහි ඇතුලත් කෙරුණු සටහන සාමාන්‍ය රාජකාරිමය වශයෙන් කරන ලද්දේ පොලිස් ස්ථානයේ සිට ඔහුගේ පිටවී යාම සාධාරණීකරණය කරනු පිණිස බව මින් හැඟෙන්නකි. පොලිසියේ වහරන බසින් එබඳු සටහන් ඇතුලත් කිරීම් ` බටා පිට බැහැර යාම් ` යනුවෙන් හඳුන්වනු ලබන බව පොලිස් සාක්ෂිකරුවෝ පැවසූහ. මෙබඳු අන්දමේ සටහන් ඇතුලත් කරනුයේ යැපීම් දීමනා ඉල්ලුම් කරනු පිණිසත් බැහැරයෑම් සඳහා නිල තත්ත්වයක් ලබාගනු පිණිසත්ය. ප්‍රියදර්ශණ කැටුව යාමට බන්දුල දිනපූර්ණ ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවද, පොලිස් ස්ථානයෙන් බැහැර සුදු පැහැයෙන් යුත් මෝටර් රියක් නවතා තිබෙනු දිනපූර්ණ දැක ඇත. මෙම මෝටර් රියෙන් පිටත එක් පුද්ගලයෙක් හිටගෙන සිටියේය. මෙම පුද්ගලයා දිනපූර්ණ කලින් දන්නා අයකු නොවිණි. ප්‍රියදර්ශණ මෝටර් රිය තිබූ ස්ථානයට ගොස් වාහනයේ ඉදිරිපස අසුනෙහි වාඩිවී ඇත. අනතුරුව, කලින් සඳහන් වුණු පුද්ගලයා විසින් පදවනු ලැබූ මෝටර් රිය බියගම විලේජ් හෝටලය දෙසට ගමන් කර ඇත්තේය. මෙම මෝටර් රිය පිටත්වන අවස්ථාව වනවිට පස්වරු 8.30 පමණ වී ඇත. ඔහු හෝ ඇය ප්‍රියදර්ශණ ජීවමානව සිටිනු දුටු බව මෙම කොමිෂන් සභාව හමුවේ කිසියම් පුද්ගලයකු කියා සිටි අවසන් අවස්ථාව මෙය වූයේය. මෙම මොහොතින් පසුව ප්‍රියදර්ශණ ආගිය අතක් ඔහුගේ පවුලේ උදවියට පවා අසන්නට ලැබී නැත.

කීර්ති අතපත්තු පස්වරු 11.00 ට පමණ පොලිස් ස්ථානයට පෙරලා පැමිණ ඇත. පොලිස් ස්ථානයට ආ පසු හෙතෙම විවේක ගැනීම පිණිස රාජකාරියෙන් මිදී යන බවට සටහනක් ඇතුලත් කර ඇත. එම වේලාවේ වුවද ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙහි නොමැත්තේ ඇයිද යනුවෙන් හෙතෙම කිසිදු විමසීමක් කර නැත. ප්‍රියදර්ශණ වෙනුවට වෙනත් ස්ථාන කාර්ය භාර නිලධාරියකු සේවයෙහි නිරතව සිටිනුයේ ඇයි දැයි යනුවෙනුදු ඔහු විමසා නැත. අතපත්තු කියන හැටියට, තමා අදාල දුරකථන ඇමතුම ප්‍රියදර්ශණට දෙමින් ඔහු බියගම විලේජ් හෝටලයට ගෙන්වා නොගත්තේ නම් ප්‍රියදර්ශණ ස්ථාන කාර්ය භාර නිලධාරී වශයෙන් වැඩ බලමින් එවේලෙහි නොසිටියේ මන්ද යන්න තම මවිතයට කරුණක් වන්නට තිබිණි.

ඊලඟ පසුදින උදැසන ( පෙබරවාරි මස 21 වෙන දින) පොලිස් ස්ථානයෙහි නිලධාරීහු ප්‍රියදර්ශණට සිදුවූයේ කුමක්දැයි මවිතය පල කරන්නට වූහ. අතපත්තු විසින් දෙනු ලැබූ දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණ බැහැර ගිය බව සිරිවර්ධන, අතපත්තුට දන්වා සිටියේය. අතපත්තු විසින් ප්‍රියදර්ශණට දුරකථන ඇමතුමක් දී ඔහු බියගම විලේජ් හෝටලයට ගෙන්වා ගත් බවට පලමු වතාවට මේ අවස්ථාවේදී යමෙකු කියා සිටි විට වුවද අතපත්තු ඒ බවට නිල වශයෙන් සටහනක් ඇතුලත් නොකලේය. සියළුම සාක්ෂි වලින් පෙනී යනුයේ එසේ තමන් දුරකථන ඇමතුමක් දුන් බව කීම ප්‍රතික්ෂේප කිරීමට නිල වශයෙන් පියවර ගැනීමක් අතපත්තුට අවශ්‍ය නොවන බවය. හෙතෙම එබඳු සටහනක් ඇතුලත් කලේ නම් තමන් ඉකුත් දින රාත්‍රියෙහි එම ඇමතුම දුන් බවට සිරිවර්ධනගේ ප්‍රකාශය ද එම සටහනට ඇතුලත් කිරීමට ඔහුට සිදුවන්නට තිබිණි. එබඳු සටහනක් ඔහු ඇතුලත් කලේ නම් එමගින් සිරිවර්ධනගේ ප්‍රකාශයෙහි විශ්වසනීයත්වය තහවුරු වන්නට ඉඩ තිබිණි. එබඳු දුරකථන ඇමතුමක් තමා විසින් දෙන ලදැයි කීම ප්‍රතික්ෂේප කිරීම හැරුණු විට, ස්වකීය සාක්ෂියේදී පවා සිරිවර්ධන විසින් තමන්ට එරෙහිව සාවද්‍ය සාක්ෂියක් දී ඇත්තේ ඇයි දැයි නිශ්චිතව හේතු දක්වන්නට අතපත්තු අපොහොසත් වනු ඇත. අනෙක් අතට, සිරිවර්ධන කියා ඇත්තේ තමා මුලදීම අදාල සිද්ධිය පිලිබඳව විවෘතව කරුණු හෙලි කර තිබූ බැවින් අතපත්තු තමාට හිරිහැර කල බවය. කෙසේ වුවද, ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම පිලිබඳව විමර්ෂණයක් කරන ලෙස අතපත්තු එදිනම එම පොලිස් ස්ථානයේ උප පරික්ෂක ජමල්ඩීන්ට නියම කර ඇත. මේ සම්බන්ධයෙන් මූලික ප්‍රශ්නයක් පැන නගී. මේ අවස්ථාව වනවිට සිරිවර්ධන කියා සිට ඇත්තේ අතපත්තු ගෙන් ලද දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙන් බැහැරව ගිය බවකි. මෙම කරුණු අනුව අතපත්තු ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීමට සම්බන්ධ වූ පුද්ගලයකු වන්නේය. කෙසේ වුවද, අතපත්තු මෙම කාරණය වහාම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුගේ අවධානයට යොමු නොකලේය. හෙතෙම ස්වකීය අධීක්ෂණය යටතේ මෙම අවස්ථානුගත කරුණ සම්බන්ධයෙන් විමර්ෂණයක් පැවැත්වීම සඳහා ස්වකීය ආසන්නතම, යටත් නිලධාරියකු වන ජමල්ඩීන් පත්කිරීම නිසි පියවර ගැනීමක් ලෙසින් සැලකීය. ජමල්ඩීන් විසින් අදාල පරීක්ෂණය පවත්වනු ලැබූ ආකාරය ඉතාමත් අවුල් සහගතය. මෙබඳු අවස්ථාවන්හි අපේක්ෂිත පරිදි ජමල්ඩීන් විසින් අතපත්තුගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබ නොතිබිණි. ඉකුත් දින රාත්‍රියේ රැස්වීමක් සඳහා අතපත්තු බියගම විලේජ් හෝටලයට ආවේද යන වගත් පසුව ප්‍රියදර්ශණ ද එහි ආවේද යන වගත් ජමල්ඩීන් එම හෝටලයට ගොස් විමසීම් කර නැත. ප්‍රියදර්ශණ ගෙදර ආවේදැයි යන්න නිශ්චිතව දැනගනු පිණිස ප්‍රියදර්ශණගේ මව්පියන්ගෙන් විමසීම් කර නැත. ප්‍රියදර්ශණ ජීවිතක්ෂයට පත්කරන ලද්දේද යන වගත් ඔහුගේ මල සිරුර හඳුනන සහ අයිතිකරුවන් නොමැති මල සිරුරු තැන්පත් කර තැබෙන පොලිස් මෘත ශරීරාගාරයට යවනු ලැබ තිබේ දැයි යන වගත් නිශ්චිත වශයෙන් සොයා දැනගැනීමට කිසිදු උත්සාහයක් දරනු ලැබ නොතිබිණි. ප්‍රියදර්ශණ විසින් එදින රාත්‍රියේ

පොලිස් ස්ථානයෙන් පිටතදී කිසියම් විමර්ෂණයක් කරනු ලැබ තිබිණි දැයි යන්න සොයා දැනගනු පිණිස කිසිදු උත්සාහයක් දරා නොතිබිණි. ජමල්ඩීන් ද, ප්‍රියදර්ශණට සිදුවූ දේ පිළිබඳව දැන ගෙන සිටි බැවින් ඔහු අතුරුදහන්වීම පිළිබඳව මූලික විමර්ෂණයන් කිරීමට පියවර නොගත් බවට යමෙකුට පැහැදිලිවම හැඟී යනු ඇත.

මේ අතර, ස්වකීය සහෝදරයා අතුරුදහන් වී ඇති බවක් කිසිසේත් නොදත් දිනේෂ්, 21 වෙන දිනදීම පෙරවරු 8.30 ට පමණ ප්‍රියදර්ශණට කථා කිරීමේ අටියෙන් පොලිස් ස්ථානයට දුරකථන ඇමතුමක් දුන්නේය. මෙම ඇමතුම දෙනු ලැබ ඇත්තේ ප්‍රියදර්ශණ විසින් මැසීම සඳහා දී ඇති ඇඳුම් ගෙන ඒම සම්බන්ධයෙනි. අතපත්තු මෙම ඇමතුමට උත්තර දී ඇත. තමා ප්‍රියදර්ශණ නිළ කාර්යයක් සඳහා බැහැර යවනු ලැබ ඇති බැවින් එම වේලාවේදී ඔහු පොලිස් ස්ථානයෙහි නොසිටින බව දැන්වීම හැරුණු විට ඉකුත් රාත්‍රියේ පොලිස් ස්ථානයෙන් බැහැර ගිය පසු ඔහු පෙරළා පොලිස් ස්ථානයට නොපැමිණි බවක් හෙතෙම දිනේෂ්ට පවසා නැත. ප්‍රියදර්ශණ ගෙදර ආවේ දැයි යන්නවත් අතපත්තු ඔහුගෙන් විමසා නොමැත. ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම පිළිබඳව කිසිදු තොරතුරක් දිනේෂ්ට දෙනු ලැබ නොතිබිණි. දහවල් කාලයේදී පමණ පොලිස් ස්ථානයට එන ලෙස අතපත්තු දිනේෂ්ට උපදෙස් දී තිබේ. එබැවින් දිනේෂ් කිසිදු කණස්සල්ලකට පත්වී නොමැත. මේ අනුව, දහවල්හි දී පමණ දිනේෂ් පොලිස් ස්ථානයට ගොස් ඇත. එම අවස්ථාවේදී අතපත්තු ක්ෂණිකව විමසුමක් කරමින් ප්‍රියදර්ශණ ගෙදර ආවේ දැයි දිනේෂ් ගෙන් ඇසීය. ඊට ` නැත ` යනුවෙන් දිනේෂ් පිළිතුරු දී ඇත. දිනේෂ් එවිටම අතපත්තුගෙන් විමසා සිටියේ ඔහු විසින් ප්‍රියදර්ශණ නිල කාර්යයක් සඳහා යවන ලදැයි දුරකථනයෙන් පැය කිහිපයකට උඩදී තමන්ට දැන්වූ බැවින් මෙබඳු විමසුමක් කරනුයේ ඇයිද යන්නය. දිනේෂ් සඳහන් කරන අන්දමට එම විමසුමට අතපත්තුට කිසිදු පිළිතුරක් දෙන්නට නොතිබිණි. කෙසේ වුවද, එම වේලාව වනවිට යම් කරදරයක් සිදුවී ඇතැයි දිනේෂ් තුළ සැකයක් ඇතිවිණි. මීට අර්ධ වශයෙන් හේතු වූයේ දිනේෂ්ට පොලිස් ස්ථානයේදී තජ් නැමැත්තා මුණගැසී තිබීමය. ඉකුත් දින රාත්‍රියේ ස්ථානාධිපතිගෙන් (අතපත්තු ) ලද දුරකථන ඇමතුමක් අනුව ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙන් බැහැර ගිය බව තජ් දිනේෂ්ට පැවසුවේය. මේ අනුව, දිනේෂ් වහාම ආපසු ගොස් අතපත්තු මුණ ගැසුනේය. තමාට ලැබී ඇති තොරතුර සාවද්‍ය බවත් ප්‍රියදර්ශණ ටික වේලාවකින් ආපසු පැමිණෙනු ඇති බවත් අතපත්තු දිනේෂ්ට පැවසීය.

පසුදින උදැසන දිනේෂ් සහ තම පියා සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගොස් ඇත. පොලිස් ස්ථානයේදී ඔවුනට ජමල්ඩීන් මුණ ගැසිණි. ප්‍රියදර්ශණ නුදුරු ස්ථානයකට ගොස් ඇති බවත් ඒ සම්බන්ධයෙන් බියට පත්වීමට කිසිදු හේතුවක් නොමැති බවත් ඔහු ඉක්මණින්ම ආපසු පැමිණෙනු ඇති බවත් ජමල්ඩීන් ඔවුනට කියා ඇත. ඔවුන් අතපත්තු හමු වූ විටදී ඔහුත් එම තත්ත්වයම යළිත් තහවුරු කර ඇත.

එදිනම දිනේෂ් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලිත් දෙල්ගොඩ මුණගැසී මෙම සිද්ධිය පිළිබඳව දන්වා සිටියේය. තමන් අදාල සිද්ධිය පිළිබඳව දන්නා බව පැවසූ දෙල්ගොඩ මෙම කාරණය සම්බන්ධයෙන් සොයා බලන්නට තමන් විසින් කණ්ඩායමක් යොදනු ලබන බවට හෙතෙම ප්‍රතිඥා දී ඇත. සත්‍ය වශයෙන්ම මෙහිදී දෙල්ගොඩ කර ඇත්තේ ` හෙතෙම අවංක නිලධාරියෙකි. ඔහු වූ කලී නීතිය අකුරටම පිළිපදිමින් ක්‍රියා කළ නිලධාරියෙකි.' යනුවෙන් පවසමින් ` චරිත සහතිකයක් දීමය.' අනතුරුව, දිනේෂ්ට හා ඔහුගේ පියා වන

එස්.එම්.අමරසේන යන අයට ඇති වූ හැඟීම වූයේ ප්‍රියදර්ශණිට කුමක් සිදුවී දැයි ඒයහ වශයෙන්ම සොයා දැනගැනීමෙහිලා දෙල්ගොඩ සැබැවින්ම උනන්දුවක් නොදක්වන බවකි.

මෙම මොහොත වනවිට ළඟපාත පිහිටි පොලිස් ස්ථානයන්හි සේවයෙහි නිරත ප්‍රියදර්ශණිගේ සමීප මිතුරෝ ද ප්‍රියදර්ශණි සෙවීමෙහි නිරතව සිටියහ. පැලියගොඩ පොලිස් ස්ථානයට අනුයුක්ත අජිත් ජයසිංහ සහ සුහසිංහ යන අයත් කිරිබත්ගොඩ පොලිස් මුරපොළට අනුයුක්ත වැදිසිංහ යන අයත් මොවුන් අතර වූහ.

පෙබරවාරි මස 23 වෙනි දින සන්ධ්‍යාවේදි දිනේෂ්ට ලැබුණු තොරතුරක් මත හෙතෙම පැලියගොඩ පොලිස් ස්ථානය බලා ගියේය. ඔහු එම පොලිස් ස්ථානයට ළඟා වනවිට බෙහෙවින් සැන්දෑ වී තිබිණි. කැලණි නදිය ගලා බසින්නේ මෙම පොලිස් ස්ථානය පිටුපසට නුදුරිනි. පොලිස් ස්ථානයේදි දිනේෂ්ට සුහසිංහ සහ වැදිසිංහ යන අය හමුවී ඇත. වැදිසිංහ සහ අනිකුත් අය කැලණි ගං ඉවුර තෙක් දිනේෂ්ව කැඳවාගෙනැවිත් ප්‍රියදර්ශණිගේ හැඩරුව ඇති මළ සිරුරක් ගඟේ පාවෙමින් පහළට ගසාගෙනැවිත් ඇති බවක් ඔහුට දන්වා එය ප්‍රියදර්ශණිගේ දැයි බලන ලෙස දිනේෂ්ට කීය. එවිට දිනේෂ් ගඟ අසබඩට ගිය අතර ඒ මොහොත වනවිටත් මළ සිරුළ ගඟ මැද පාවෙමින් තිබිණ. පොලිස් නිලධාරීහු එවිට මළසිරුර ගං ඉවුරට ඇද ගත්හ. එම මළ සිරුරට හානි සිදුවී ඇති බවක් දිනේෂ් දුටුවේය. සිරුරේ මුහුණෙහි කොටසක් නොතිබිණි. අත් පා ආදියෙහි කොටස්ද තුවාල වී තිබිණි. එහි මුහුණ හඳුනාගැනීමට දිනේෂ්ට නොහැකි විය. මළ සිරුර ඉදිමී ගොසිනි. එසේ වුවත් ප්‍රියදර්ශණිගේ සිරුරෙහි තිබූ සුවිශේෂී ලක්ෂණයක් එහි දක්නට ලැබිණි. එම ලක්ෂණය වනුයේ උපතින්ම ප්‍රියදර්ශණිගේ පපු පෙදෙස මත තනපුඩු හතරක් තිබීමය. එක පැත්තක තනපුඩු දෙක බැගින් ඒවා දෙපසෙහිම පිහිටා තිබිණි. මෙම තනපුඩු හතරින් සිරුරෙහි එක පැත්තක තනපුඩු දෙකක් තිබුණු බවත් අනික් පැත්තෙහි එකක් තිබුණු බවත් දිනේෂ් දැක ඇත. එක් තනපුඩුවක් පමණක් දක්නට ලැබුණු පැත්තෙහි පපු ප්‍රදේශයේ (මෙහි මුලදී තනපුඩු හතරක්ම තිබිණි ) හම පළුදු වී තිබිණි. මෙකී නියත හඳුනාගැනීමට අමතරව මළ සිරුර කලිසමකින් සැරසී තිබුණ බවත් එය දිනේෂ් සහ ප්‍රියදර්ශණි යන දෙදෙනාම හවුලේ පාවිච්චි කල එකක් බවත් දිනේෂ්ට වැටහිණි. තමන් දෙදෙනාම ශාරීරික පෙනුමින් සහ ප්‍රමාණයෙන් එක සමාන වූ බැවින් මෙපරිදි ඇඳුම් හවුලේ පාවිච්චි කිරීම පොදු ලක්ෂණයක් විණි. මෙම සිද්ධිය වූ ස්ථානයේ සිටි දිනේෂ් සහ අනිකුත් නිලධාරීන්ට මුහුණේ හැඩරුවෙන් සිරුර හඳුනාගත නොහැකි වුවද ඉහත කී හේතූන් නිසා එම සිරුර සත්‍ය වශයෙන්ම ප්‍රියදර්ශණිගේ බවට ඔවුහු සැහීමට පත්වූහ. ප්‍රියදර්ශණිගේ සිරුරෙහි තනපුඩු හතරක් තිබිණැයි යන කාරණය ඔහුත් සමඟ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සිටි ඔහුගේ මිත්‍රයින් සාක්ෂි දුන් විට සනාථ විණි. ප්‍රියදර්ශණිගේ සිරුරෙහි තනපුඩු හතරක් තිබුණැයි යන්න කාරණය පුළුල් වශයෙන් ප්‍රචලිත කරුණකි. අදාල කාරණය සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීම පිණිස පසු දින ආපසු පැමිණෙන මෙන් මෙම නිලධාරීන් විසින් දිනේෂ්ට උපදෙස් දෙන ලදි. මෙහිදී සාමාන්‍ය පිළිවෙත අනුව මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුව තිබුණැයි යනුවෙන් හැඟීමක් කෙනෙකු තුළ ඇත්වන්නේය.

මෙම මළ සිරුර හඳුනාගනු ලැබුවායින් පසුව එම ස්ථානයෙහි සිටි නිලධාරීහු මළ සිරුර ගඟේ පාවෙමින් තිබියදීම එය ලණුවක ආධාරයෙන් අසල පිහිටි ගසක බැඳ තැබූහ. පොලීසියෙහි මෙම ක්‍රියා කලාපය නියත වශයෙන්ම අසාමාන්‍ය වූවකි. කෙසේ වූවත්, මෙම අසාමාන්‍ය ක්‍රියා

කලාපයට තුඩු දී ඇත්තේ මෙම මුළු සිද්ධිය පිළිබඳව නිසි විමර්ෂණයක් පවත්වන්නට පොලිස් බලාධිකාරිය කැමැත්තක් නොදැක්වීම බවක් පෙනෙන්නට ඇත.

පසුදින උදෑසනම දිනේෂ් තම පියාත් කැටුව පොලිස් ස්ථානයට පෙරළා පැමිණියේය. පොලිස් ස්ථානයේදී ඔවුනට ප්‍රියදර්ශණිගේ මිතුරන් හමු වූ අතර ඔවුහු ප්‍රියදර්ශණිට කුමක් සිදුවී දැයි යන්න නිශ්චිත වශයෙන්ම සොයා දැනගැනීමෙහිලා අවංකවම උනන්දුවක් දැක්වූහ. ඉනික්බිතිව ඔවුහු ගං ඉවුර අසලට ගියහ. එවේලෙහි එම මළ සිරුර එහි නොතිබීම ඔවුනගේ විමතියට කාරණයක් විය. මළ සිරුර ගසක බැඳ තැබීමට පාවිච්චි කෙරුණු කඹය කපා දමා තිබිණි. මළ සිරුරට කුමක් වී දැයි යන්න පිළිබඳව කරුණු පැහැදිලි කර දෙමින් ඔවුනට සහායවීමට එම රාත්‍රිය තුළ පැලියගොඩ පොලිස් ස්ථානයෙහි රාජකාරියෙහි නිරතව සිටි නිලධාරීහු අසමත් වූහ. පැලියගොඩ පොලිස් ස්ථානය බෙහෙවින් ආරක්ෂක රැකවල් යෙදූ ස්ථානයක් බව සාක්ෂි වලින් කියැවිණි. ඇත්ත වශයෙන්ම, පොලිස් ස්ථානය පිහිටි භූමියෙහි පසුභාගයේ හොඳින් විදුලි ආලෝකය දල්වා තිබිණි. ප්‍රියදර්ශණිගේ සිරුරට සිදුවූයේ කුමක්ද? පැලියගොඩ පොලිස් ස්ථානයෙහි බලධාරීන්ගේ එකඟත්වයෙන් තොරව ක්‍රියාත්මක වූ පිටස්තරයකු විසින් ප්‍රියදර්ශණිගේ මළ සිරුර ඉවතට ගෙනයන්නට ඇත්ද? එසේ නැතහොත්, එවැන්නකු විසින් කඹය කපා දැමීම නිසා මළ සිරුර ගඟ දිගේ මුහුදට පාවී යන්නට ඇත්ද?

මේ අවස්ථාව වනවිට ප්‍රියදර්ශණිගේ පවුලේ උදවියගේ සිත්හි පැහැදිලි වශයෙන්ම තිබූ හැඟීම වූයේ ප්‍රියදර්ශණි අතුරුදහන්වීම සම්බන්ධයෙන් විමර්ෂණයන් පැවැත්වීමෙහිලා ප්‍රදේශයේ පොලිස් බලධාරීන් හැකි උපරිම මට්ටමින් උනන්දුවක් නොදක්වන බවකි. එබැවින් 1990 පෙබරවාරි මස 24 වන දින පස්වරු 7.00 ට ප්‍රියදර්ශණිගේ පියා පොලිස් මූලස්ථානය බලා ගොස් ප්‍රියදර්ශණි අතුරුදහන්වීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළේය.

මෙකල්හිදී හෝ මෙකල්හිදී පමණ වැදිසිංහ සහ සුභසිංහ යන අය ස්ථානාධිපති අතපත්තු හමුවී ප්‍රියදර්ශණිට කුමක් සිදුවී තිබිණි දැයි ඔහුගෙන් විමසූහ. මෙම කාරණය සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය පිළිබඳව ඔවුහු ස්වකීය අසතුට පළ කර සිටියහ. ' බල්ලෙක් මළත් මීට වඩා හොඳ පරීක්ෂණ පවත්වනවා ' යනුවෙන් ප්‍රකාශ කර සිටි ඔවුහු මෙම අතුරුදහන්වීම සම්බන්ධයෙන් ඔබ පරීක්ෂණයක් නොකරන්නේ මන්දැයි යනුවෙනුත් විමසා සිටියහ. ' සිදු වී ඇති දේ කුමක්දැයි තමන් නොදන්නා බවත් ඔහු ගිය කොතැනකින් හෝ එනු ඇතැයි ' යනුවෙන් අතපත්තු තර්ජනාත්මක විලාශයකින් පිළිවදන් දී ඇත.

සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් පිටවී ගොස් පැය දෙකක කාලයක් ඇතුළතදී ඔවුන් දෙදෙනාට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ ගෙන් රාජකාරී පණිවුඩයක් ලැබී ඇත. තමාට ඔවුන් දෙදෙන නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න හමුවට ඉදිරිපත් කරන්නට සිදුව ඇති බැවින් පසුදින උදෑසනින්ම තමා ඉදිරියේ පෙනී සිටින ලෙස එම පණිවුඩ වලින් ඔවුනට නියම කෙරිණි. කලින් දිනයේදී ඔවුන් සපුගස්කන්ද පොලිස් ස්ථානයට ගොස් පොලිස් ස්ථානයට හානි කිරීමට ( ' සමතලා කරන්නට ' ) තර්ජනය කළේ ඇයිදැයි දෙල්ගොඩ විමසීය. එවැන්නක් කළැයි කීම ඔවුන් දෙදෙනා ප්‍රතික්ෂේප කර සිටියහ. කෙසේ වුවද, දෙල්ගොඩ විසින් ඔවුන් මෙරිල් ගුණරත්න හමුවට ඉදිරිපත් කරන ලදී. '' මියගිය තැනැත්තන් සොයා යාමෙන් කරදරයට පත්නොවන්නැයි '' නියෝජ්‍ය පොලිස්පති වැදිසිංහට අවවාද කළේය. තමන් නවදුරටත් ප්‍රියදර්ශණි සෙවීමට කටයුතු කළහොත් යාපනයට මාරු කරන බවට නියෝජ්‍ය පොලිස්පති

මෙරිල් ගුණරත්න සුහසිංහට අවවාද කළේය. ඔවුන් දෙදෙනා නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්නගේ කාර්යාලයේ සිට ආපසු පැමිණෙද්දී ඔවුනට අතපත්තු මුණ ගැසිනි. තමන් පොලිස් ස්ථානය සමතලා කරන්නට යන බවට ඔවුන් ඔහුට කියා ඇති බවට අසත්‍යයක් උසස් නිලධාරීන්ට පැවසුවේ ඇයිදැයි ඔවුහු නිතැතින්ම අතපත්තුගෙන් විමසූහ. මේ සම්බන්ධයෙන් මුණගැසී කරුණු පැහැදිලි කර ගැනීම සඳහා තමන් සමඟවින් නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න හමුවන ලෙස ඔවුහු අතපත්තුගෙන් ඉල්ලා සිටියහ. අදාල සිද්ධිය සම්බන්ධයෙන් උසස් නිලධාරීන්ට තමා දන්වා ඇතැයි කීම අතපත්තු ප්‍රතික්ෂේප කළේය. වැදිසිංහ හා සුහසිංහ කැටුව නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ගේ කාර්යාලයට යාමටද ඔහු ප්‍රතික්ෂේප කළේය.

ඉනික්බිතිව, පැලියගොඩ පොලිස් ස්ථානයේදී වැදිසිංහට සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මුණගැසුණි. ප්‍රියදර්ශණගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් දැඟලීමක් නොකරන ලෙස වැදිසිංහට තර්ජනය කර සිටි සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් තමන් මේ අයුරින් දිගටම ක්‍රියා කළහොත් ප්‍රියදර්ශණට සිදුවූ ඉරණමටම තමන්ටත් මුහුණපාන්නට සිදුවන බව ඔහු කියා සිටියහ. කෙසේ වුවද, වැදිසිංහ සහ සුහසිංහ තවදුරටත් ප්‍රියදර්ශණ සෙවීම සඳහා ක්‍රියා කළහ. මේ අතර, අජිත් ජයසිංහ ද ප්‍රියදර්ශණ සොයා යමින් සිටියේය. අජිත් ජයසිංහ නිවාඩු ලබාගෙන පූර්ණ කාලීනව ප්‍රියදර්ශණ සෙවීමේ ව්‍යායාමයෙහි නිරතවිය. මෙම කාලසීමාව තුළදී වැදිසිංහට ලැබුණු තොරතුරකින් කියැවුණේ අජිත් ජයසිංහ, ප්‍රියදර්ශණ සෙවීමෙහිලා අවංකවම උනන්දුවක් දක්වන බැවින් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් උරණ වී ඇති බවකි. එබැවින් ජයසිංහ ලුහුබැඳ යාමට ඔහු විසින් කණ්ඩායම් දෙකක් යොදවනු ලැබ ඇතැයි ද එම තොරතුරින් වැඩිදුරටත් කියැවිණි. ජයසිංහ පැහැරගෙන යාමටත් ඔහුට හානි පමුණුවන්නටත් ඉඩ ඇතැයි වැදිසිංහ ගිතියට පත්වී සිටියේය. එබැවින්, මේ සම්බන්ධයෙන් හෙතෙම ජයසිංහට අවවාද කර ඇත.

කෙසේ වුවද, තමන් පිස්තෝලයක් සහ අත් බෝම්බයක් රැගෙන යමින් සිටින බැවින් තමන් ගිතියට පත් නොවන බවත් තවදුරටත් ප්‍රියදර්ශණ සෙවීමේ ව්‍යායාමයෙහි තමන් නිරත වන බවත් ජයසිංහ කියා සිටියේය. සිය ක්‍රියා කලාපය නිසා ජයසිංහට සත්‍ය වශයෙන්ම කුමක් සිදුවිද යන්න ඊළඟ පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

ප්‍රියදර්ශණ අතුරුදහන්වීමෙන් අනතුරුව ගෙවී ගිය මුල් කාලපරිච්ඡේදය තුළදී ඔහු කිසිදු නීති විරෝධී කටයුත්තක හෝ වෙනත් අපකීර්තිමත් චර්යාවක යෙදී සිටි බවට ඔහුට එරෙහිව කිසිවකු විසින් කිසිදු චෝදනාවක් නොනැඟුණු බව සැලකුව මනාය. ඇත්ත වශයෙන්ම, එකල්හි කාගේත් පොදු මතය වූයේ ප්‍රියදර්ශණ වූ කලී අවංකභාවය හා කාර්යක්ෂමතාව අතින් කිසිවකුට ප්‍රශ්න කළ නොහැකි වූ විශිෂ්ඨ ගණයේ නිලධරයකු බවයි.

ප්‍රියදර්ශණ අතුරුදහන් වූ තැන් පටන් ගත වී ඇති කාලයත් ( හත් වසරකි) ඔහුගේ මළ සිරුර සොයා ගැනීමත් ( අදාල මළ සිරුරෙහි අනන්‍යතාව නීත්‍යානුකූල වශයෙන් නිශ්චිතව තහවුරු කරනු ලැබ නොතිබිණි.) හේතු කොටගෙන මෙම කොමිෂන් සභාව එළඹී ඇති නිගමනය වනුයේ ප්‍රියදර්ශණ බියගම විලේජ් හෝටලයේදී හෝ එම හෝටලයේ සිට ඔහු ගෙන යනු ලැබූ වෙනත් ස්ථානයකදී මරණයට පත් කරනු ලැබූ බවය. මෙම නිගමනයට එළඹෙන්නට අප පෙළඹී ඇත්තේ, විශේෂයෙන්ම 20 වෙනි දින රාත්‍රියෙහි පොලිස් ස්ථානයට එකී දුරකථන ඇමතුම දුන් බව කීම සහ ප්‍රියදර්ශණ එම හෝටලයට කැඳවූ බව කීම පොලිස් පරීක්ෂක අතපත්තු

ප්‍රතික්ෂේප කල හෙයිනි. එතෙකුදු වුවත්, එදින සන්ධ්‍යාවෙහි සාකච්ඡාවක් සඳහා තමන් එම හෝටලයට ගිය බව අතපත්තු පිළිගත්තේය. ප්‍රියදර්ශණ පොලිස් ස්ථානයෙන් නික්ම ගිය මොහොතේ සිට ඔහුට සිදුවූයේ කුමක්දැයි නිශ්චිත වශයෙන් සොයා දැනගනු පිණිස මෙම කොමිසන් සභාවට අනුයුක්ත විමර්ෂකයින් විසින් දරන ලද විමර්ෂනාත්මක ප්‍රයත්නයන් තුළින් කිසිදු නියත ප්‍රතිඵලයක් අති නොවුණි. මේ සම්බන්ධයෙන් කිසියම් අතිශයින් වැදගත් හෝඩුවාවත් සැපයිය හැකි තත්ත්වයක සිටි සියළුම පුද්ගලයෝ එම සිද්ධිය සම්බන්ධයෙන් කිසිවක් දත් බව කීම ප්‍රතික්ෂේප කළහ. නැතහොත් නිරුත්තරව සිටියහ. ප්‍රියදර්ශණට කවර ඉරණමකට මුහුණ පෑමට සිදුවූයේ ද යන්න ඔහුගේ අතුරුදහන්වීමට සම්බන්ධ වුවත් පමණක් දන්නා කරුණක් වන අතර ඔවුනට ස්වකීය ජීවිතයේ ඉතිරි කාලය පීඩාකාරී හෘද සාක්ෂියකින් ( ඔවුනට එවැන්නක් ඇතොත්) යුතුව ගත කරන්නට සිදුවනු ඇත.